


# අනුන්ට උදවු කරමු

## අනාථයන්ගේ සහ වැන්දඹුවන්ගේ යහපත සුරකිමු

වරක් පුද්ගලයෙක් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් වෙත පැමිණ තම සිතෙහි දැඩි බව පිළිබඳව කීවේ ය. එවිට එතුමාණෝ "ඔබේ සිත සැහැල්ලු වීමත්, ඔබේ අරමුණ ඉටුවීමත් ප්‍රිය කරන්නෙහි නම්, අනාථයන් සමඟ ආදරයෙන් කටයුතු කරන්න; ආදරයෙන් ඔවුන්ගේ හිස පිරිමදින්න; ඔබ අනුභව කරනා දෙයින් ඔවුන්ටත් දෙන්න. (මෙසේ කරන විට) ඔබේ සිත සැහැල්ලු වෙයි; ඔබේ අවශ්‍යතා සපුරාලනු ලබයි" යැයි පැවසූහ. (තබරානි)

අල්ලාහ් ලොව මවා එහි කෝටි සංඛ්‍යාත මිනිසුන් මවා ඇත්තේ ය. මෙලොව හා එහි ඇති සියල්ල කිසියම් විශේෂිත පිරිසක් වෙනුවෙන් පමණක් මවන ලද්දක් නොවේ. මෙලොව ජීවත් වන සියලු දෙනා වෙනුවෙන් ඒවා මවා තිබේ.

එබැවින් "තමන් පමණක් කා බී, ඇඳ පැලඳ භුක්ති විඳිය යුතු ය" යන පටු ආකල්පයෙන් හා ආත්මාර්ථකාමීත්වයෙන් ජීවත් වීම වරදකි. "සියලු දෙනා සතුටින් ජීවත් විය යුතු ය" යන්න ප්‍රිය කිරීම ද, ඒ වෙනුවෙන් කැපවීම ද ශ්‍රේෂ්ඨ වේ. ආදරය, රැකවරණය, ආහාර පාන, ඇඳුම් පැලඳුම් යන අවශ්‍යතා සියල්ලන්ට ම පොදු වූ ඒවා ය. අප සතුටින් ජීවත් වීමට ප්‍රිය කරන්නාක් සේ ම ඊට අන් අය ද ප්‍රිය කරන බව වටහා ගත යුතු ය.

"තමන් ප්‍රිය කරනා දේ තම සහෝදරයාට ප්‍රිය කරන තාක් ඔබෙන් කිසිවෙක් සැබෑ විශ්වාසවන්තයෙක් නොවන්නේ ය" යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

දෙමාපියන්ගෙන් තොර දරුවන් නොමැත. නමුත් මව්පියන් අහිමිවූවෝ අනාථයෝ වෙති. සැමියකු නොමැතිව බිරිඳක් නොමැත. නමුත් සැමියා අහිමි වූ තැනැත්තියෝ වැන්දඹු වෙති. අනාථයන් හා වැන්දඹුවන් රැක බලාගන්නට කෙනෙකු නොමැතිව ළත වන අයුරු දැකගත හැකි ය. සෑම කෙනෙකුට ම විවිධාකාර අවශ්‍යතා තිබෙන්නේ ය. ඒවා ඉටු කිරීමට අදාළ අය සිටින විට එහි බර නොදැනේ. දෙමව්පියන්, භාරකරුවන් අහිමි වන විට අවශ්‍යතාවල ප්‍රබලත්වයත්, එය ඉටු කළ නොහැකිව ළතවීමත් වටහා ගත හැකි ය. එවිට ජීවිතය කටුක වී කලකිරීමට පත් වේ. එය හේතුකොට ගෙන ඔවුන් හට මඟ වරදවා ගැනීමේ අවස්ථා ඇති වේ.

එබැවින් **අනාථයා පීඩාවට පත් නොකරවු. තව ද යාචකයා පලවා නොහරිවු.** (අල් කුර්ආන් 93:9,10) යනුවෙන් කුර්ආනය උපදෙස් දෙන්නේ ය.

"වැන්දඹුවන් හා දුප්පතුන් වෙනුවෙන් උපයන්නා සලකා බලනවිට ඔහු අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කරන්නා, ළැදියාවෙන් නැමඳුමෙහි යෙදෙන්නා, අඛණ්ඩව උපවාසයේ යෙදෙන්නා යනාදී කෙනෙකු වැනි වේ" යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

ධනවතුන්ට දුගී බව, බඩගින්න, දරිද්‍රතාව යනාදිය නොවැටහේ. ආඩම්බරකම ඔවුන්ගේ ඇස් පියවා දමන්නේ ය. මෙමඟින් දුප්පතුන්, අනාථයන්, වැන්දඹුවන් යනාදීන්ගේ දුක් කම්කටුලු ධනවතුන්ගේ දෙසවනට යොමු නොවී පවතී. ඔවුන්ගේ සිතේ අඥෝනාව හා වේදනාව කඳුළට මුසු වී යන්නේ ය.

**(ඕ : නබි) නුඹ විනිශ්චය දිනය බොරු කරන්නා ව බැලුවෙහි ද, ඔහුව අනාථ දරුවාව එලවා දමයි. ඔහු දුප්පතුන්ට ආහාර ලබා දීමට (අන් අයව) නොපොළඹවන්නේ ය. තමන්ගේ සලාතයන් හී නොසැලකිලිමත්ම නැමඳුම් කරන්නන්ට විපතමය. ඔවුන් (අන් අයව) පෙන්වනු පිණිස නැමඳුම් කරන්නේ ය. තව ද ඔවුහු අල්ප ද්‍රව්‍යයක් ද අන් අයට නොදී වළක්වා ගනිති.** (107:1-7)

අනාථයන් ඉතා හොඳින් රැක බලාගත යුතු යි. ඔවුන්ට ආදරය දැක්විය යුතු යි. ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර දිය යුතු යි. ඔවුන්ගේ අනාගතය සුරැකිය යුතු යි. මේවා පිවිතුරු චේතනාවෙන් ඉටු කරන විට මෙය ද නැමඳුමක් ලෙස සැලකේ. මෙවන් ගුණාංග නිසා ඔවුන්ට යහමග ඔස්සේ සිතන්නටත්, ක්‍රියා කිරීමටත් මග පෑදේ.

"තමන්ගේ පාර්ශ්වයේ නැතහොත් තමන් නොදන්නා අනාථයකුගේ භාරකාරත්වය දරන්නා ද මම ද ස්වර්ගයේ මෙලෙස සිටින්නෙමු" යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ තමන්ගේ ඇඟිලි දෙක එක් කොට දක්වා විස්තර කළහ.

තම පවුලට හෝ වෙනත් අනාථයකුට දක්වන ආදරය හා රැකවරණය වෙනුවෙන් ස්වර්ගයේ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් සමඟ සිටීමේ භාග්‍යය ලැබේ. එය ද මැදැඟිල්ලත්, දඹරැඟිල්ලත් මෙන් ළඟින් ම සිටීමේ හැකියාව ලැබෙන බව නබිතුමාණෝ පෙන්වා දුන්හ.

''යතීම්'' නමින් අමතනු ලබන අනාථයන් භාරව කටයුතු කරන අය අසාධාරණ ලෙස කටයුතු නොකළ යුතු ය. එලෙස කිරීම ඉමහත් ද්‍රෝහීකමකි. ඔවුන්ට හිමි ධන සම්පත් කුමක් වුව ද ඒවා සුරක්ෂිත කොට නියමිත වයසට පැමිණි කල එය ඔවුනට භාරදිය යුතු ය.



ඔවුන්ට භාරකරුවන් නොමැති හේතු මත ඔවුන් සම්බන්ධ කරුණෙහි අයුක්ති සහගත නොවිය යුතු ය.

**"සැබැවින් ම කවරෙකු අයුක්ති සහගතව අනාථයන්ගේ වස්තුව භුක්ති විඳින්නේ ද ඔවුහු තම කුසට අනුභව කරනුයේ ගින්දර ය. තව ද ඔවුහු දළු ලා ඇවිළෙන ගින්නෙහි පිවිස දැවෙති." (අල් කුර්ආන් 4:10)**

වැන්දඹු කාන්තාවෝ සමාජයේ බහුල වශයෙන් දක්නට ලැබෙති. ඔවුන්ට ද රැකවරණය ලබා දිය යුතු යි. ඔවුන්ට අවශ්‍ය රැකවරණය නිසි ලෙස නොදුන් කල ඔවුන් මෙන් ම දරුවන් ද ඉමහත් දුෂ්කරතාවට පත් වෙති. නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමා වැන්දඹුවන්ගේ මතු දිවියට නොයෙකුත් මගපෙන්වීම් සලසා ඇත්තාහ; වැන්දඹුවන් විවාහ කර ගත්තෝ ය; එලෙස ම සහාබාවරුන්ටත් ඔවුන් විවාහ කරගන්නා ලෙස දිරි ගැන්වූහ.

එලෙස ම සමාජයේ ආබාධිතයින්, අසාධ්‍ය රෝගීන්, රැක බලාගැනීමට කිසිවකු නැති වයෝවෘද්ධයන් වැනි අන් අයගේ උදවු උපකාර බලාපොරොත්තු වන්නෝ බොහෝ සිටිති. ඔවුන්ගේ නොහැකියාව, දුක් කම්කටුලු පිළිබඳව සොයා බැලිය යුතු ය. ඔවුන්ට ද උදවු උපකාර ලබා දිය යුතු ය.

දුප්පතුන් ඉවත් කොට, ධනවතුන්ට පමණක් ආරාධනා කරනු ලබන වලීමා සංග්‍රහය (විවාහ ආහාරය) සංග්‍රහයන්ගෙන් මිලේච්ඡතම සංග්‍රහය වේ" යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

"ඔබ අතර සිටින දුබලයන් හේතුවෙනි, ඔබට උපකාර කෙරෙන්නේ. ඔවුන් හේතුවෙනි ඔබට ආහාර සපයනු ලබන්නේ'' යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (බුහාරි)

"මා වෙනුවෙන් දුබලයන් සොයන්න. ඔබ අතර සිටින දුබලයින් හේතුවෙන් ඔබට උපකාර කරනු ලැබීමත්, ආහාර දෙනු ලැබීමත් සිදු වේ" යැයි නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (අබුදාවූද්)

සමාජයේ කොටස්කරුවන් වන අනාථයන්, වැන්දඹුවන්, රෝගීන්, වයෝවෘද්ධයන්, සහ දුබලයන් හඳුනා ගෙන ඔවුන්ට ලබා දිය හැකි සියලු උදවු උපකාර ලබාදී සමාජ රැකවරණයත් දේව කරුණාවත් ලබා ගනිමු.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

وَلِيْمَةٌ يَتِيْمٌ

**අභ්‍යාස**

හිස්තැන් පුරවන්න.

1. අනාථයන්ට ආදරය දැක්වීමෙන් සිතේ ................................. ඇති වේ.
2. තමන් ප්‍රිය කරනා දේ තම ...................................... ප්‍රිය කරනා තුරු ඔබගෙන් කිසිවකු ......................... නොවේ.
3. ................................ කෝප නොවන්න ................................ පලවා නොහරින්න, යනු අල් කුර්ආනයේ උපදෙසකි.
4. පරලොවෙහි විනිශ්චය බොරු කරන්නා, ................................. පලවා හරින්නා, දුප්පතුන්ට .............................. නොදෙන්නා වන්නේ ය.
5. ............................. අහක් කොට .................................... ආරාධනා කරනු ලබන විවාහ සංග්‍රහය ඉතා පිළිකුල් ය.
6. ඔබට ................................. කරනු ලැබීමත්, ............................................ සපයනු ලැබීමත් දුබලයන් හේතු කොට ගෙන ය.